## පරිච්ඡේදය 06

# ව්‍යාපාර සංවිධාන

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

6.1 ව්‍යාපාර සංවිධාන හැඳින්වීම
6.2 ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම
6.3 තනි ස්වාමි ව්‍යාපාර
6.4 හවුල් ව්‍යාපාර
6.5 සංස්ථාපිත සමාගම්





නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 6.1 ව්‍යාපාර සංවිධාන හැඳින්වීම

වර්තමානයේ දී පුද්ගලයන්ට තම අවශ්‍යතා සහ වුවමනා ඉටුකර දීම පිණිස විවිධ ව්‍යාපාර සහය වේ. මේ අනුව පුද්ගලයන්ගේ දෛනික ජීවිතයේ සියලු ම කාර්යයන් සමග ව්‍යාපාර සම්බන්ධ වේ. දෛනික මිනිස් අවශ්‍යතා වන ආහාරපාන ඇඳුම්පැළඳුම් ආදිය පමණක් නොව සියලු ම එදිනෙදා අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා ව්‍යාපාරවල මැදිහත්වීමක් දක්නට ලැබේ. මෙම ව්‍යාපාර විවිධ ආකාරයට සංවිධානය වී ඇත. එම එක් එක් සංවිධාන පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

**නිදසුන් :-**

ඔබ භාවිත කරන පොත්පත්, පෑන්, පැන්සල් යනාදී භාණ්ඩ
බැංකු සේවා, රක්ෂණ සේවා ආදිය සපයන විවිධ ආයතන

### *ක්‍රියාකාරකම 01*

ඔබ නිවසේ එදිනෙදා වුවමනාවන් කිහිපයක් දක්වා ඒවා සපුරා ගැනීමට සහය වන ව්‍යාපාර ආයතන නම් කරන්න.

| අනු අංකය | වුවමනාව | ව්‍යාපාර ආයතනය |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04 | | |
| 05. | | |

ඉහත ක්‍රියාකාරකමෙහි නියැලුණු ඔබට තම අවශ්‍යතා සහ වුවමනා සපුරාගැනීම පිණිස විවිධ පාර්ශ්වයන්ගේ සහය ලබාගැනීමට සිදුවන බවත්, මේ සියල්ල පසුපස ව්‍යාපාර පවතින බවත් පැහැදිලි වනු ඇත. ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට පුද්ගලයන් කණ්ඩායම් ලෙසින් සංවිධානය විය යුතු ය. මෙසේ පොදු අරමුණක් ඉටුකර ගැනීම පිණිස ඒකරාශි වූ පුද්ගල කණ්ඩායමකින් සැදුම්ලත් ඒකක සංවිධාන නම් වේ. මේ අනුව වර්තමානයේ දී මිනිසුන්ගේ අවශ්‍යතා සහ වුවමනා ඉටුකිරීම පිණිස විවිධ ව්‍යාපාර සංවිධාන බිහිවී ඇත.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලීම පිණිස සීමිත සම්පත් භාවිත කරමින් ලාභ ඉපැයීම, සමාජ සුභසාධනය හෝ වෙනත් කිසියම් අරමුණක් ඉටුකර ගැනීම පිණිස භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදා හැරීමේ නිරත වන ආයතන ව්‍යාපාර සංවිධාන වේ.**

ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- පොදු අරමුණක් පැවතීම
- සීමිත සම්පත් භාවිතය
- සාමූහික සම්බන්ධතාවක් පැවතීම
- ආර්ථික කටයුත්තක නියැලීම
- පුද්ගල කණ්ඩායමක් ඒකරාශී වී සිටීම (අයිතිකරුවන්, සේවකයන් ආදිය)

## 6.2 ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

වර්තමානයේ දී මිනිසුන්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම පිණිස විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග ගොඩනගාගෙන ඇත.

මෙසේ නිර්මාණය වී තිබෙන විවිධ ස්වරූපයේ ව්‍යාපාර සංවිධාන, විවිධ නිර්ණායක අනුව වර්ග කළ හැකි ය. ඒවා අතරින් බහුල ව භාවිත වන පහත දැක්වෙන ප්‍රධාන නිර්ණායක පමණක් සලකා බැලේ.

- හිමිකාරත්වය අනුව
- අරමුණ අනුව

### හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මූල්‍ය සම්පත් සපයා ඇති ආකාරය පදනම් කර ගනිමින් ව්‍යාපාරයේ හිමිකාරත්වය විස්තර කෙරේ. ව්‍යාපාරයට සම්පත් යොදවන පාර්ශ්ව හිමිකරුවන් ලෙස හැඳින්වේ. ව්‍යාපාරයක් උපයන ලාභ හෝ අලාභ භුක්ති විඳින්නේ ව්‍යාපාරයේ හිමිකරුවෝ ය.


**හිමිකාරත්වය පදනම් කරගනිමින් ව්‍යාපාර සංවිධාන පහත දැක්වෙන ලෙස වර්ග කෙරේ.**

- පෞද්ගලික අංශයේ ව්‍යාපාර
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර

ව්‍යාපාරවලට පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් මූල්‍ය සම්පත් යොදා ඇති විට ඒවායේ හිමිකාරත්වය පෞද්ගලික අංශය සතු වේ. එවිට ඒවා පෞද්ගලික අංශයේ ව්‍යාපාර වේ.

එසේම ව්‍යාපාර සඳහා රජය මූල්‍ය සම්පත් යොදා ඇති විට දී ඒවායේ හිමිකාරත්වය රජය සතු වන අතර එවිට ඒවා රාජ්‍ය අංශයේ ව්‍යාපාර ලෙස හැඳින්වේ.

හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි ආකාරය පහත දැක්වේ.




*රූපය 6.1 හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම*

## අරමුණ අනුව ව්‍යාපාර සංවිධානය වර්ග කිරීම

ව්‍යවසායකයෝ විවිධ අරමුණු සාක්ෂාත් කරගැනීමේ අභිලාශයෙන් ව්‍යාපාර පවත්වාගෙන යති. ව්‍යාපාර පවත්වාගෙන යන අරමුණු අනුව ඒවා පහත සඳහන් පරිදි වර්ග කළ හැකි ය.

- ලාභ අරමුණ කරගත් ව්‍යාපාර
- ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර

ව්‍යවසායකයකු ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන්නේ පිරිවැයක් දරමින් භාණ්ඩ හා සේවා වෙළෙඳපළට ඉදිරිපත් කොට ලාභ ඉපැයීම ප්‍රධාන අරමුණ කරගෙන නම්, එවැනි ව්‍යාපාර ලාභ අරමුණු කරගත් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

**නිදසුන් :-**

පෞද්ගලික රෝහල්
පෞද්ගලික බැංකු
සුපිරි වෙළෙඳසැල්
ඇඟළුම් නිෂ්පාදන ආයතන




නොමිලේ බෙදා හැරීම සඳහා ය.

එසේම සමහර ව්‍යාපාරවල ප්‍රධාන අරමුණ පිරිවැයක් දරා භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ලාභ ඉපැයීම නොව සාමාජයීය වශයෙන් ප්‍රතිලාභ ලබා දීමයි. එවැනි ව්‍යාපාර ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

**නිදසුන් :-**

රතු කුරුස සංවිධානය
සිංහ සමාජය
සර්වෝදය
ක්‍රීඩා සංගම්

ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සහ ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ ද ක්‍රියාත්මක වේ. අරමුණ පදනම් කර ගනිමින් ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම 6.2 රූපය මගින් නිරූපණය කෙරේ.




*රූපය 6.2 අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම*

### ක්‍රියාකාරකම 02

ඔබගේ එදිනෙදා ජීවිතයේ වුවමනාවන් ඉටුකර ගන්නා ආයතන කිහිපයක් සඳහන් කර එම ආයතන සම්බන්ධ ව තොරතුරු පහත දී ඇති වගුවට අනුව සම්පූර්ණ කරන්න.

| අනු අංකය | ආයතනය | අරමුණ | හිමිකාරත්වය |
|---|---|---|---|
| 01 | සුපිරි වෙළෙඳසැල | ලාභය | පෞද්ගලික |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |

ඉහත තොරතුරු අධ්‍යයනය කළ ඔබට ව්‍යවසායකයන් විසින් ආරම්භ කොට පවත්වා ගෙන යන ව්‍යාපාර විවිධ පදනම් ඔස්සේ වර්ගකළ හැකි බව අවබෝධ වී ඇතැයි සිතමු. මෙම ව්‍යාපාර සංවිධාන වර්ග අතුරින් තමන්ට වඩාත් ම සුදුසු ව්‍යාපාර සංවිධානය කුමක් දැයි තෝරාගෙන එය පවත්වාගෙන යාම සඳහා ව්‍යවසායකයෙකු දක්ෂ විය යුතු ය.

මෙම පරිච්ඡේදයේ අප සාකච්ඡා කරනු ලබන්නේ හිමිකාරත්වය පදනම් කර ගනිමින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික අංශයේ පහත දැක්වෙන ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ ව පමණි.

- කේවල ස්වාමි ව්‍යාපාර
- හවුල් ව්‍යාපාර
- සංස්ථාපිත සමාගම්

## 6.3 කේවල ස්වාමි ව්‍යාපාර

වර්තමානයේ බොහෝ ව්‍යවසායකයන් විසින් ආරම්භකොට පවත්වාගෙන යන ව්‍යාපාර සංවිධාන වර්ගයක් ලෙස කේවල ස්වාමි ව්‍යාපාර හඳුනාගත හැකි ය. මේවා ඒක පුද්ගල ව්‍යාපාර, තනි පුද්ගල ව්‍යාපාර යන නම්වලින් ද හැඳින්වේ. ව්‍යවසායකයන්ට සුළු ප්‍රාග්ධනයකින් ඉතා පහසුවෙන් මේවා ආරම්භ කළ හැකි බැවින් ලොව සෑම රටකම පාහේ මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය ව්‍යාප්ත වී ඇති බව පෙනේ.



රූපය 6.3

හිමිකාරිත්වය තනි පුද්ගලයෙකු සතු, අයිතිකරු විසින් ම ආරම්භ කොට ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර වේ.

### කේවල ස්වාමි ව්‍යාපාරවල මූලික ලක්ෂණ

කේවල ස්වාමි ව්‍යාපාරවල මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රාග්ධනය අයිතිකරු විසින් යෙදවීම

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍යවන විවිධ සම්පත් ලබා ගැනීම සඳහා මූලික ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. එම ප්‍රාග්ධනය අයිතිකරු විසින් ම සැපයීම කේවල ස්වාමි ව්‍යාපාරයක ලක්ෂණයකි. තමා ඉතිරි කරගත් මුදලකින්, නෑදෑ හිතමිතුරන්ගෙන් සපයාගත් මුදලකින්, තම වත්කමක් විකුණා හෝ ඇපයට තබා ලබාගත් ණය මුදලකින් හෝ මූල්‍ය ආයතනයකින් ලබාගත් ණය මුදලකින් වැනි විවිධ මාර්ගවලින් ව්‍යාපාරයට ප්‍රාග්ධනය සපයා ගත හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

P හිමිකාරත්වය තනි පුද්ගලයෙකු සතු වීම

කේවල ස්වාමි ව්‍යාපාරවලට අවශ්‍ය ප්‍රාග්ධනය සපයන්නේ තනි පුද්ගලයෙකු බැවින් ඒවායේ හිමිකාරත්වය ද ප්‍රාග්ධනය සැපයූ එම පුද්ගලයාටම හිමි වේ.

P ලාභ හෝ පාඩු තනි ව භුක්ති විඳීම

ව්‍යාපාරය විසින් උපයන ලාභය ව්‍යාපාරයේ අයිතිකරු සතු වේ. එසේම ව්‍යාපාරයට අලාභයක් ඇති වුවහොත් එය ද අයිතිකරුට තනි ව විඳ දරා ගැනීමට සිදුවේ.

P අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

ව්‍යවසායකයාගේ මරණය, සිහිවිකල්වීම හෝ වෙන යම් අකර්මණ්‍යතාවයක දී එම ව්‍යාපාරයේ පැවැත්ම අවසන් විය හැකි ය.

P අයිතිකරුගේ වගකීම අසීමිත වීම

වගකීම යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් වන්නේ ව්‍යාපාරය සඳහා බාහිර පාර්ශ්වයන්ගෙන් ලබාගත් ණය පියවීම සඳහා ඇති බැඳීමයි. මෙවැනි ව්‍යාපාරවල අයිතිකරුගේ වගකීම අසීමිත වේ. එනම් ව්‍යාපාරිකයා සතු පෞද්ගලික දේපල පවා ව්‍යාපාරයේ වගකීම් පියවීමට කැප කිරීමට සිදුවිය හැකි බවයි.

P ලියාපදිංචිය අනිවාර්ය නොවීම

කේවල ස්වාමි ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ. එසේ වුව ද තම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ. එසේ ලියාපදිංචි කරන්නේ නම් එය ව්‍යාපාර නාම ලියාපදිංචිය වේ. මෙහි දී ලියාපදිංචි කරනුයේ ව්‍යාපාරයේ නම වේ. ව්‍යාපාර නාමය ලියාපදිංචිය සිදු කෙරෙන්නේ 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත අනුව අදාළ පළාත් සභාවේ ව්‍යාපාරය පවතින බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි.

P නෛතික පුද්ගලභාවයක් නොමැති වීම

මෙවැනි ව්‍යාපාරවලට ව්‍යාපාරයේ නමින් නීතිමය කටයුතුවල යෙදිය නොහැකි බව මින් අදහස් කෙරේ. එසේ කිරීමට අවශ්‍ය නම් ව්‍යාපාරිකයාගේ පෞද්ගලික නමින් ඒවා සිදු කළ යුතු වේ.

**නිදසුන් :-**

නඩු පැවරීම, බැංකු ණය ගැනීම, රථ වාහන මිල දී ගැනීම වැනි කටයුතු ව්‍යාපාර නාමයෙන් නොව අයිතිකරුගේ නමින් කළ යුතු ය.

P අයිතිකරුගේ අභිමතය පරිදි ව්‍යාපාරය මෙහෙයවිය හැකි වීම

**නිදසුන් :-**

සේවකයන් බඳවා ගැනීම හා ඉවත් කිරීම
ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම
භාණ්ඩවල මිල පිළිබඳ තීරණ ගැනීම

### කේවල ස්වාමි ව්‍යාපාර ආරම්භ කිරීම

කේවල ස්වාමි ව්‍යාපාර ආරම්භ කිරීම පහසු වුව ද, ඒ සඳහා ව්‍යවසායකයෙකු විසින් ප්‍රායෝගික ව අනුගමනය කළ යුතු පියවර කිහිපයකි. ඒවා පහත සඳහන් පරිදි වේ.

P ව්‍යාපාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බල ප්‍රදේශයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් පහත දැක්වෙන ඉල්ලුම් පත්‍ර ලබා ගැනීම

1. තනි පුද්ගල ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය
2. ව්‍යාපර නාම ලියාපදිංචි කිරීම සඳහා වූ ග්‍රාම නිළධාරි වාර්තාවට අදාළ ඉල්ලුම්පත්‍රය

P ග්‍රාම නිළධාරි සහතික කළ වාර්තාව හා සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය ලියාපදිංචි කිරීමට අදාළ ගාස්තුව සමග ප්‍රාදේශිය ලේකම් වෙත භාරදීම

ඉහත ලියකියවිලි හා ගාස්තු ගෙවීමෙන් පසු ව ඒවා පිළිබඳ ප්‍රාදේශීය ලේකම් විසින් කරුණු සොයා බලා පිළිගන්නේ නම් ව්‍යාපාරය ලියාපදිංචි කර ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කෙරේ.



*ක්‍රියාකාරකම 03*

කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදාළ ආකෘති පත්‍ර සපයා ගන්න.

01. එම ආකෘති පත්‍රවල විමසා ඇති කරුණු නිරීක්ෂණය කරන්න.
02. ඔබේ යහළුවන් සමග සාකච්ඡා කර එම ලේඛන සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු ගොනු කරන්න.

### කේවල ස්වාමි ව්‍යාපාරවල වාසි

P සුළු ප්‍රාග්ධනයකින් වුවද ආරම්භ කළ හැකි වීම
P පවුලේ සාමාජිකයන්ගේ සහය ලබාගත හැකි වීම
P ව්‍යාපාරය ආරම්භ කිරීමේ පහසුව



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

P වයාපාරිකයාගේ උනන්දුව හා කැපවීම මත වයාපාරය දියුණු කරගත හැකි වීම

P ස්වාධීන ව තීරණ ගත හැකි වීම

P සියලුම ලාභ අයිතිකරු සතුවීම

P වයාපාරික තොරතුරුවල රහසයභාවය ආරක්ෂා වීම

P බලපාන නීතිරීති අල්ප වීම

**කේවල ස්වාමි වයාපාරවල සීමා**

P ප්‍රාග්ධන සම්පාදන මාර්ග සීමා වීම

P වයාපාරයට නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම

P අයිතිකරුගේ වගකීම අසීමිත වීම

P වයාපාරයට අඛණ්ඩ පැවත්මක් නොමැති වීම

P වයාපාර අලාභ අයිතිකරුට තනි ව දැරීමට සිදුවීම

P අයිතිකරු තනි ව ගනු ලබන වයාපාරික තීරණ ඇතැම් විට අසාර්ථක වීම

**ක්‍රියාකාරකම 04**

*සමන් විසින් තමා ඉතිරිකරගත් සුළු මුදලකින් වෙළෙඳ වයාපාරයක් ආරම්භ කළේ ය. එම ආරම්භක කටයුතු සඳහා ඔහුට වැඩි වෙහෙසක් හා කාලයක් දැරීමට සිදු නොවීම පිළිබඳ ව ඔහු සතුටු විය. ඔහු වයාපාරයට කැපවීමෙන් වැඩ කළේ ය.*

*විවිධ දුෂ්කරතා මතු වුව ද ඔහු ඒවාට ක්ෂණික විසඳුම් ලබා දෙමින් එම ගැටලු තම අත්දැකීම් බවට පරිවර්තනය කර ගනිමින් වයාපාර කටයුතු පවත්වාගෙන ගියේ ය. එක් විටක දී සේවකයෙකු ගෙන් සිදු වූ අත් වැරැද්දක් නිසා ඔහුට විරුද්ධ ව ගනුදෙනුකරුවෙකු නඩු පවරනු ලැබූ බැවින් සමන්ට උසාවියේ පෙනී සිටීමට ද සිදු විය. කෙසේ වුව ද තමාගේ සැලසුම් අනුව ක්‍රියාත්මක වෙමින් වයාපාරය ලාභදායී ව පවත්වාගෙන යාමට ඔහුට හැකි විය.*

*තම වයාපාරය තව දුරටත් දියුණු කර ගැනීමට සමන්ට අවශයතාවක් මතු වුව ද ඒ සඳහා අමතර ප්‍රාග්ධනය සපයා ගැනීම දුෂ්කර බව ඔහුට අවබෝධ විය. මෙහි දී තව දුරටත් බැංකු ණය ලබා ගැනීමේ හැකියාව තිබුණ ද ඒවා බේරුම් කිරීමේ අවදානම හේතු කොට ගෙන ඔහු ඒ සඳහා උනන්දු නොවිය.*

*තම වයාපාරයේ වැඩ කටයුතු අධික බැවින් සමන් රෝගාතුර තත්ත්වයට පත් වුව ද වයාපාර කටයුතු හැකි පමණ සාර්ථක ව කිරීමට ඔහු නිතර ම වෙහෙස ගත්තේ ය.*

01. ඉහත දක්වූ වයාපාරය කුමන වයාපාර සංවිධානයකට අයත් ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

02. එම වයාපාර සංවිධාන වර්ගයේ වාසි හා සීමා දක්වන්න.

## 6.4 හවුල් ව්‍යාපාර

පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ගයක් ලෙස හවුල් ව්‍යාපාරවලට ද ආර්ථිකය තුළ වැදගත් ස්ථානයක් හිමි ව ඇත. ව්‍යවසායකයන් තනි තනි ව ව්‍යාපාරික කටයුතුවල නිරතවීමට වඩා සාමූහික ව ක්‍රියාකළ හැකි වීම හවුල් ව්‍යාපාර බිහි වීමට හේතු වී ඇති බව පෙනේ. එමෙන්ම වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගැනීම, නිවැරදි කළමනාකරණ තීරණ ගැනීම, විවිධ කුසලතා ඇති පාර්ශ්ව ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීම වැනි අවශ්‍යතා මුල් කරගෙන හවුල් ව්‍යාපාර බිහි වී ඇති බව කිව හැකි ය. ගණකාධිකාරී, නීතිඥ, බදු, වෛද්‍ය වැනි වෘත්තීමය ක්ෂේත්‍රවල යෙදෙන පාර්ශ්ව ද නිෂ්පාදන හා වෙළෙඳ කටයුතුවල යෙදෙන පාර්ශ්ව ද හවුල් ව්‍යාපාර පවත්වාගෙන යනු දැකිය හැකි ය.

ශ්‍රී ලංකාවේ පවත්වා ගෙන යන හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් 1890 හවුල් ව්‍යාපාර අඥා පනත බලපැවැත්වේ. එම පනතට අනුව හවුල් ව්‍යාපාර පහත දැක්වෙන පරිදි නිර්වචනය කර ඇත.

ලාභ ලැබීමේ අරමුණින් පුද්ලයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසකගේ සම්බන්ධතාව හවුල් ව්‍යාපාර වේ.



රූපය 6.4

### හවුල් ව්‍යාපාර වල මූලික ලක්ෂණ

හවුල් ව්‍යාපාරවල දැකිය හැකි සුවිශේෂී වූ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- හවුල්කරුවන් සංඛ්‍යාව

හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා සිටිය යුතු අවම හවුල්කරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු විය යුතු අතර උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව විසිදෙනෙකුට සීමා කර ඇත.

- හවුල්කරුවන් අතර ගිවිසුම්ගත සම්බන්ධතාවක් පැවතීම

හවුල්කරුවන් අතර ඇති කරගත් එකඟතා මත හවුල් ව්‍යාපාරයක් ආරම්භ වේ. එම එකඟතාව ලිඛිත ව, වාචික ව හෝ ව්‍යංගයෙන් ඇති විය හැකි ය. මෙසේ හවුල් ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය ආශ්‍රිත ව හවුල්කරුවන් අතර ඇතිකරගත් එකඟතාව හවුල් ගිවිසුම ලෙස හැඳින්වේ.

- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

හවුල් ගිවිසුම වෙනස් වීම, හවුල්කරුවෙකුගේ මරණය, උමතුවීම, බුන්වත් වීම වැනි හේතු මගින් හවුල් ව්‍යාපාරයේ පැවැත්මට බාධා ඇතිවිය හැකි බව මින් විස්තර කෙරේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

P හවුල්කරුවන්ගේ වගකීම් අසීමිත වීම

හවුල් ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය තුළින් ඇතිවන වගකීම් සඳහා හවුල්කරුවන් සීමාවකින් තොර ව වගකීමෙන් බැඳෙන බව මින් පැහැදිලි කෙරේ. හවුල් ව්‍යාපාරයේ වගකීම් පියවීමේ දී එහි වත්කම් ප්‍රමාණවත් නොවේ නම් හවුල්කරුවන්ගේ පෞද්ගලික දේපළ පවා සීමාවකින් තොර ව යොදවමින් ව්‍යාපාරයේ ණය පියවීමට හවුල්කරුවන්ට මෙහි දී සිදුවේ.

P නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම

හවුල් ව්‍යාපාරයක් නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස නොසලකන බැවින් හවුල් ව්‍යාපාරයේ නමින් නීතිමය කටයුතුවලට එළඹීමට නොහැකි වේ. එම නිසා හවුල් ව්‍යාපාරය ආශ්‍රිත නීතිමය කටයුතුවල දී හවුල් ව්‍යාපාරයේ නමින් නොව ඒ ඒ හවුල්කරුවන්ගේ පෞද්ගලික නාමයන්ගෙන් කටයුතු කිරීම සිදුවේ.

P හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවීම

හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ. එහෙත් හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීමෙන් බොහෝ ප්‍රයෝජන අත් කර ගත හැකි ය. මෙහි දී ලියාපදිංචි කරනු ලබන්නේ ව්‍යාපාරයේ නාමයයි. ලියාපදංචි කිරීම 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත අනුව අදාළ පළාත් සභාවේ ව්‍යාපාරය පිහිටි බල ප්‍රදේශය අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කර ගත හැකි ය.

P සෑම හවුල්කරුවෙකුම සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු වීම

හවුල් ව්‍යාපාරයේ කටයුතුවල දී ඒ ඒ හවුල්කරුවා විසින් සිදුකරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් අනෙක් හවුල්කරුවන් ද වගකීමට බැඳේ. එම නිසා සෑම හවුල්කරුවෙකුම අන් හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු ලෙස සැලකේ.

## හවුල් ව්‍යාපාර ආරම්භ කිරීම

කේවල ස්වාමි ව්‍යාපාර ආරම්භ කළ අයුරින් ම හවුල් ව්‍යාපාර ද ආරම්භ කළ හැකි ය. එහෙත් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් උපරිම වශයෙන් විසිදෙනෙකු සිටිය හැකි බැවින් ආරම්භ කොට පවත්වා ගෙන යාමේ දී විවිධ ප්‍රායෝගික ගැටලුවලට මුහුණදීමට සිදුවිය හැකි ය. හවුල් ගිවිසුමක් වාචික ව හෝ ව්‍යංගයෙන් හෝ ලිඛිත යන ආකාරවලින් ඇති කර ගත හැකි වුවද ලිඛිත ගිවිසුමක් මත හවුල් ව්‍යාපාරය ආරම්භ කොට පවත්වාගෙන යාම වඩාත් යෝග්‍ය වේ.



රූපය 6.5

මෙසේ ඇති කර ගන්නා ගිවිසුම්ගත ලිඛිත එකඟතාව හවුල් ඔප්පුව ලෙස හැඳින්වේ.

හවුල් ව්‍යාපාර ආශ්‍රිත ව ඇති කරගනු ලබන ගිවිසුම්ගත එකඟතාව ලිඛිත ව සිදු කිරීම වැදගත් වනුයේ ප්‍රායෝගික ව හවුල් ව්‍යාපාරයේ ඇතිවිය හැකි ගැටළුවලින් තොර ව එය පවත්වාගෙන යාම පිණිස වේ.

**හවුල් ගිවිසුමක ඇතුළත් විය හැකි එකඟතා කිහිපයක් පහත දැක්වේ.**

- හවුල්කරුවන් ප්‍රාග්ධනය සපයන ආකාරය
- හවුල්කරුවන් ලාභ පාඩු බෙදා ගන්නා ආකාරය
- හවුල්කරුවන් ව්‍යාපාරයේ කටයුතුවලට දායක වන ආකාරය
- හවුල්කරුවන්ගේ වැටුප් ලබා ගැනීම
- හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම්
- හවුල් ව්‍යාපාරයේ කටයුතු අවසන් කිරීම සම්බන්ධ තොරතුරු
- ප්‍රාග්ධනයට අමතර ව හවුල්කරුවන් සපයනු ලබන ණය සඳහා පොලී ගෙවීම
- හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වෙනත් පොදු එකඟතා

## හවුල් ව්‍යාපාරවල වාසි

- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම
- සාමූහික තීරණ ගත හැකි වීම
- හවුල් ව්‍යාපාරයේ වගකීම් හවුල්කරුවන් අතර බෙදී යාම
- හවුල්කරුවන් සතු විවිධ කුසලතා ප්‍රයෝජනයට යොදාගත හැකි වීම

## හවුල් ව්‍යාපරවල සීමා

- වගකීම අසීමිත වීම
- නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
- හවුල්කරුවන් අතර මත ගැටුම් ඇතිවිය හැකි වීම
- ව්‍යාපාරයේ ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
- යම් හවුල්කරුවෙකු විසින් සිදුකරන වැරදි ක්‍රියාවක ප්‍රතිඵල අනෙකුත් හවුල්කරුවන්ට බලපෑම

**ක්‍රියාකාරකම 05**

*අමල් පියරත්න සහ කමල් ජයරත්න එක් ව ආරම්භ කළ නිමි ඇඳුම් අලෙවි කිරීමේ හවුල් ව්‍යාපාරය රත්න ඩ්‍රෙස් නමින් ලියාපදිංචි කිරීමට එකඟ වූහ. හවුල් ව්‍යාපාරය සඳහා දෙදෙනාම රුපියල් 50 000ක් බැගින් ප්‍රාග්ධනය යෙදීමටත්, ව්‍යාපාරයේ ලාභපාඩු දෙදෙනා අතර සම සම ව බෙදා ගැනීමටත් එකඟ විය. කමල් වෙනත් වෘත්තියක නියැලීම නිසා ඔහු ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ නොවීමට තීරණය කළ අතර මාසික ව රුපියල් 20 000ක වේතනයකට අමල් ව්‍යාපාරයේ අලෙවි කටයුතුවලට සම්බන්ධ විය යුතු බවට එකඟ වන ලදි. තවද, ප්‍රාග්ධනයට අමතර ව හවුල්කරුවන් ව්‍යාපාරයට යොදවන අතිරේක අරමුදල් සඳහා 10% වාර්ෂික පොලියක් ගෙවීමට ද තීරණය කරන ලදි. එසේ ම නව හවුල්කරුවෙකු ව්‍යාපාරයට බඳවා ගන්නේ නම් ඔවුන් දෙදෙනාගේම කැමැත්ත මත එය සිදුවිය යුතු බවට තීරණය විය.*

ඉහත තොරතුරු ඇසුරෙන් රත්න ඩ්‍රෙස් හවුල් ව්‍යාපාරයට අදාළ ව හවුල් ඔප්පුවක් පිළියෙල කරන්න.

## 6.5 සංස්ථාපිත සමාගම්

පෞද්ගලික අංශය නියෝජනය කරනු ලබන ප්‍රචලිත ව්‍යාපාර සංවිධාන වර්ගයක් ලෙස සංස්ථාපිත සමාගම් හඳුනා ගැනේ. සංස්ථාපිත සමාගම් ආරම්භ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ 2007 අංක 07 දරන සමාගම් පනත බල පැවැත්වේ.

ශ්‍රී ලංකාවේ සමාගම් පනතට අනුව එක් පුද්ගලයෙකුට වුවද සංස්ථාපිත සමාගමක් ආරම්භ කළ හැකි බැවින් බොහෝ ව්‍යවසායකයන් මේවා ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන බව පෙනේ. එසේම සංස්ථාපිත සමාගම් සඳහා නෛතික පුද්ගලභාවයක් හිමි වීම ද ජනප්‍රිය වීමට හේතු වී ඇත.

සංස්ථාපිත සමාගම් පහත සඳහන් පරිදි සරල ව අර්ථ දැක්විය හැකි ය.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද නෛතික පුද්ගලභාවයක් හා අඛණ්ඩ පැවැත්මත් ඇති ව්‍යාපාර සංවිධානය සංස්ථාපිත සමාගම් වේ.

### සංස්ථාපිත සමාගම්වල මූලික ලක්ෂණ

සංස්ථාපිත සමාගම්වල පොදුවේ දැකිය හැකි මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

P සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ආයතනයක් වීම

සෑම සමාගමක් ම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ යුතු ය. එය සිදු කරන්නේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසිනි.

P කොටස්කරුවන් මගින් ප්‍රාග්ධනය රැස්කර ගැනීම

සංස්ථාපිත සමාගමකට අවශ්‍ය ප්‍රාග්ධනය රැස්කර ගනු ලබන්නේ කොටස් ප්‍රාග්ධනය තුළිනි.

P කොටස්කරුවන්ගේ වගකීම සීමාසහිත වීම

සංස්ථාපිත සමාගමක ණය හා වෙනත් බැඳීම් සම්බන්ධයෙන් කොටස්කරුවන්ගේ වගකීම සීමිත වේ. සමාගමෙන් මිලදී ගත් කොටස්වල වටිනාකමට පමණක් කොටස්කරුවන්ගේ වගකීම සීමාවන බව මින් අදහස් කෙරේ.

P සාමගමේ කළමනාකරණ කටයුතු අධ්‍යක්‍ෂවරු මගින් සිදු කිරීම

සමාගමක කළමනාකරණ කටයුතු සිදු කරනු ලබන්නේ සමාගමේ කොටස්කරුවන් වන අයිතිකරුවන් විසින් තෝරාපත් කර ගන්නා අධ්‍යක්‍ෂවරු විසිනි.


P අඛණ්ඩ පැවැත්මක් හිමිවීම

සංස්ථාපිත සමාගමක් එහි කොටස්කරුවන්ගෙන් වෙන් වූ ස්වාධීන ඒකකයකි. එබැවින් සමාගමේ කොටස්කරුවෙකුගේ මිය යාම, බුන්වත් වීම, පූර්ණ හෝ අර්ධ අකර්මන්‍යතාවය වැනි හේතු සමාගමේ පැවැත්මට බාධාවක් නොවේ.

P නෛතික පුද්ගල භාවයක් හිමි වීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම් සංස්ථාපනය කෙරේ. එබැවින් සංස්ථාපිත සමාගමක් නීතය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස සැලකේ. එමනිසා ගිවිසුම්වලට එළඹීම, වත්කම් අත්පත් කර ගැනීම, මූල්‍ය ආයතනවලින් ණය මුදල් සම්පාදනය කරගැනීම වැනි කාර්යයන්හි දී සමාගමේ නමින් ඒවා ක්‍රියාත්මක කළ හැකි ය.

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව ආරම්භ කළ හැකි සමාගම් වර්ග 6.6 සටහන මගින් නිරූපනය කෙරේ.




*රූපය 6.6 සමාගම් පනත අනුව ඇරඹිය හැකි සමාගම් වර්ග*

සමාගම් පනතට අනුව විවිධ වර්ගයේ සමාගම් ආරම්භ කළ හැකි ය. මෙහි දී අප සාකච්ඡා කරනු ලබන්නේ සීමා සහිත පෞද්ගලික සමාගම් පිළිබඳ ව පමණි. බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් විසින් ස්වකීය ව්‍යාපාර සඳහා මෙම වර්ගයේ සමාගම්වලට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.

## සීමා සහිත පෞද්ගලික සමාගම්

ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයන් අතර වර්තමානයේ දී ජනප්‍රිය වී තිබෙන ව්‍යාපාර සංවිධාන වර්ගයක් ලෙස සීමා සහිත පෞද්ගලික සමාගම් හඳුනාගත හැකි ය. එක් පුද්ගලයෙකුට වුවද ආරම්භ කළ හැකි වීම, නෛතික පුද්ගල භාවයක් හිමිවීම, පවුලේ සාමාජිකයන් හිතමිතුරන් වැනි පාර්ශ්ව සම්බන්ධකර ගනිමින් ව්‍යාපාරය ආරම්භ කළ හැකි වීම වැනි කරුණු මෙම පසුබිම නිර්මාණය වීමට හේතු වී ඇති බව පෙනේ.

2007 අංක 07 දරන සමාගම් පනත මගින් ද සීමා සහිත පෞද්ගලික සමාගම් පිළිබඳ අර්ථ නිරූපනයක් ඉදිරිපත් කොට ඇති අතර, එය සරල ව මෙසේ දැක්විය හැකි ය.

සමාගමක් විසින් නිකුත් කරන කොටස් මිල දී ගන්නා ලෙස පොදු මහජනතාවට ආරාධනා කළ නොහැකි, සාමාජික සංඛ්‍යාව 50 කට සීමාවන, වගකීම යෙදූ ප්‍රාග්ධනයට පමණක් සීමා වන සමාගම් සීමාසහිත පෞද්ගලික සමාගම් වේ.

**ක්‍රියාකාරකම 06**

පහත සඳහන් එක් එක් ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සීමිත පෞද්ගලික සමාගම් ලැයිස්තුගත කරන්න.

| අනු අංකය | ක්ෂේත්‍රය | පෞද්ගලික සමාගම් |
|---|---|---|
| 01. | සංචාරක | |
| 02. | අධ්‍යාපන | |
| 03. | වෙළෙඳ | |
| 04. | නිෂ්පාදන | |
| 05. | කෘෂිකර්ම | |
| 06. | ඉදි කිරීම් | |

## සීමා සහිත පෞද්ගලික සමාගම් ආරම්භ කිරීම

සීමා සහිත පෞද්ගලික සමාගමක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතු ය. ඒ සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා පහත දැක්වෙන ලියවිලි 4 ඉදිරිපත් කළ යුතු වේ.

01. සමාගමේ නම පිළිබඳ ප්‍රකාශය

සීමා සහිත සමාගමකට නාමයක් තෝරා ගැනීමේදී අනුගමනය කළ යුතු විධිවිධාන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පෙන්වා දී ඇත.

**නිදසුන්** :-

දැනට භාවිත කරන නමක් හෝ ඊට ආසන්න අනුරූප නමක් හෝ සමාගමේ නාමය ලෙස භාවිත නොකළ යුතු බව

ශ්‍රී ලංකා, රාජ්‍ය, ජනාධිපති වැනි වචන කණ්ඩ සමාගමේ නාමය සඳහා භාවිත නොකළ යුතු බව

02. සාංගමික ව්‍යවස්ථාවලිය

සීමා සහිත සමාගමක සාමාන්‍ය පරිපාලනය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් ප්‍රකාශය සාංගමික ව්‍යවස්ථාවලිය වේ. 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සාංගමික ව්‍යවස්ථාවලියේ පහත දැක්වෙන තොරතුරු ඇතුළත් වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

සමාගමේ පරමාර්ථ
සමාගමේ කොටස් හිමියන්ගේ බැඳීම් හා අයිතිවාසිකම්
සමාගමේ කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ තොරතුරු

03. සමාගමේ අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කිරීමට ඒ ඒ අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශ

04. සමාගමේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට එම ලේකම්වරයාගේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශනය

මෙම ඉදිරිපත් කරනු ලබන ලියවිලි පිළිබඳ ව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන්නේ නම් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබේ. ලියාපදිංචි කිරීමෙන් පසු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සංස්ථාපන සහතිකය නිකුත් කරනු ලැබේ.

## සීමා සහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ

සීමා සහිත පෞද්ගලික සමාගම්වල පොදුවේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- සමාගමේ කොටස් මිලට ගැනීමට පොදු මහජනතාවට ආරාධනා කළ නොහැකි වීම

සීමිත පෞද්ගලික සමාගම්වල කොටස් මිලදී ගැනීම පවුලේ සාමජිකයන් සහ හිතමිතුරන් වැනි පාර්ශ්ව අතර පමණක් සිදු කෙරේ. මෙම සමාගම්වල කොටස් මිලට ගන්නා ලෙස පොදු මහජනතාවට ආරාධනා කළ නොහැකි ය.

- අවම සාමාජික සංඛ්‍යාව 01 වන අතර උපරිම සංඛ්‍යාව 50ක් වීම

2007 සමාගම් පනතට අනුව එක් පුද්ගලයෙකුට වුවද සමාගමක් ආරම්භ කළ හැකි බැවින් සීමා සහිත පෞද්ගලික සමාගම්වල අවම කොටස්කරුවන් සංඛ්‍යාව 01කි. එසේම මෙවැනි සමාගම්වල උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව සමාගම් පනත මගින් 50 කට සීමා කොට ඇත.

- අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කිරීම

සීමිත සමාගම්වල කළමනාකරණ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු කෙරේ. මේ සඳහා සීමිත පෞද්ගලික සමාගමක අවම වශයෙන් එක් අධ්‍යක්ෂවරයෙක්වත් සිටිය යුතු බව සමාගම් පනතෙහි දැක්වේ. එසේ වුව ද සිටිය යුතු උපරිම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පිළිබඳ ව සඳහන් කොට නැත.

- නෛතික පුද්ගලභාවයක් හිමි වීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම

- ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම
- වගකීම සීමා සහිත වීම

**සීමිත පෞද්ගලික සමාගම්වල වාසි**

- එක් පුද්ගලයෙකුට වුව ද ආරම්භ කළ හැකි වීම
- සමාගමේ හිමිකාරිත්වය සුළු පිරිසක් සතු වීම නිසා පාලනය පහසු වීම
- සමාගමේ ලාභය, සුළු පිරිසක් අතර පමණක් බෙදීයාම
- පවුලේ සාමාජිකයන්, නෑදෑ හිත මිතුරන් සම්බන්ධ කර ගනිමින් සමාගම ආරම්භ කළ හැකි වීම
- විධිමත් බවක් හා ඉහළ පිළිගැනීමක් පැවතීම
- වගකීම සීමිත වීම
- නෛතික පුද්ගලභාවයක් හිමි වීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම

**සීමිත පෞද්ගලික සමාගම්වල සීමා**

- පවුලේ සාමාජිකයන්, නෑදෑ හිත මිතුරන් වැනි පාර්ශ්වවලට කොටස් නිකුත් කරන බැවින් වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගැනීමට අපහසු වීම.
- අනිවාර්යයෙන් පිළිපැදිය යුතු නීති රීති හා ක්‍රියා පටිපාටි පැවතීම
- සමාගමේ උපරිම කොටස්කරුවන් ගණන 50 සීමා කිරීම හේතුවෙන්, වැඩි පිරිසකට සම්බන්ධ වීමට ඇති අවස්ථා සීමා වීම


## වරලත් ව්‍යාපාර

සීඝ්‍රයෙන් වෙනස්වන ව්‍යාපාර පරිසර තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ඇති වූ ව්‍යාපාර සංකල්පයක් ලෙස වරලත් ව්‍යාපාර හඳුනාගත හැකි ය. මහා පරිමාණ ව්‍යාපාර සමග සම්බන්ධ වී ව්‍යවසායකයාට තම ව්‍යාපාර කටයුතු ආරම්භ කර පවත්වාගෙන යාමට මෙමගින් අවස්ථාව ලැබේ. මෙම ව්‍යාපාර තනි පුද්ගල, හවුල් ව්‍යාපාර හෝ සංස්ථාපිත සමාගම් යන සංවිධාන වර්ග යටතේ ක්‍රියාත්මක විය හැකි ය.

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක්, සිය වෙළෙඳ නාමය යටතේ එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳපල ප්‍රදේශයක අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට බලය පැවරීමට යොදාගන්නා ව්‍යාපාර වරලත් ව්‍යාපාර වේ.

### වරලත් ව්‍යාපාර ආරම්භ කිරීම

වර්තමානයේදී වරලත් ව්‍යාපාර විවිධ ස්වරූපයෙන් ආරම්භ කොට ක්‍රියාත්මක කෙරේ. එසේ වුවත් සෑම වරලත් ව්‍යාපාරයකම මූලික සැකසුම පහත දැක්වේ.




රූපය 6.7 වරලත් ව්‍යාපාරයක මූලික සැකසුම

**වරලත් ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙකකි.**

- වරලත් හිමියා/වරලත්කරු
  ස්වකීය නිෂ්පාදිත නිශ්චිත වෙළෙඳපළ ප්‍රදේශයක තමාගේ වෙළෙඳ නාමය භාවිත කරමින් අලෙවි කිරීමට අවසරය ලබාදෙන පාර්ශ්වය වේ. ඔහුගේ පරමාර්ථ වන්නේ ස්වකීය වෙළෙඳපළ ප්‍රාග්ධනය ආයෝජනයකින් තොර ව පුළුල් කර ගැනීම හා ආදයම් ඉපැයීම වැනි කරුණු වේ.

- වරලත්ලාභියා
  වරලත් හිමියාගේ සන්නම් නාමය භාවිත කරමින් නිශ්චිත වෙළෙඳපළ ප්‍රදේශයක භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීමට අවසරය ලබාගන්නා පාර්ශවය වේ.

මෙවැනි ව්‍යාපාර සම්බන්ධතාවක් ඇති කර ගැනීම සඳහා වරලත් හිමියා සහ වරලත් ලාභියා යන දෙපාර්ශ්වය අතර ගිවිසුම්ගත සම්බන්ධතාවයක් ගොඩනගා ගත යුතු ය. එය වරලත් ගිවිසුම නම් වේ. වරලත් ව්‍යාපාරය ආරම්භ කොට පවත්වාගෙන යාම පිළිබඳ ව පොදු එකඟතා වරලත් ගිවිසුමට ඇතුළත් කරයි.

එවැනි පොදු එකඟතා සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**නිදසුන් :-**

වරලත්ලාභියාට, වරලත්හිමියා විසින් සපයන සේවා

අලෙවියට අවසර ලබා දී තිබෙන භාණ්ඩ වර්ග

වරලත්ලාභියා විසින් වරලත්හිමියාට කරන ගෙවීමේ වටිනාකම

මෙසේ වරලත්හිමියා සහ වරලත්ලාභියා විසින් ඇති කරගත් වරලත් ගිවිසුමේ ප්‍රතිඵලය ලෙස වරලත් ව්‍යාපාරය ඇරඹේ. මෙහි දී වරලත් හිමියා විසින් තම වෙළෙඳ නාමය යටතේ භාණ්ඩ හා සේවා විකිණීමට වරලත් ලාභියාට ලබාදෙන අවසරය මත ගාස්තු අය කෙරේ. එසේ අයකරන ගාස්තුව පුරස්කාරය ලෙස හැඳින්වේ.

## වරලත් ව්‍යාපාරවල මූලික ලක්ෂණ

වරලත් ව්‍යාපාරවල පහත දැක්වෙන මූලික ලක්ෂණ නිරූපණය වේ.

P වරලත්හිමියා හා වරලත්ලාභියා ලෙස දෙපාර්ශවයක් සම්බන්ධ වීම

නිශ්චිත වෙළෙඳපළ ප්‍රදේශයක තම වෙළෙඳනාමය යටතේ භාණ්ඩ හා සේවා අලෙවි කිරීමට අවසරය ලබාදෙන්නේ වරලත්හිමියා ය. එම අවසරය මත අදාළ වෙළෙඳනාමය යටතේ නිශ්චිත වෙළෙඳපළ ප්‍රදේශ තුළ භාණ්ඩ හා සේවා අලෙවි කරනු ලබන්නේ වරලත් ලාභියා විසිනි. මෙසේ වරලත් ව්‍යාපාර ආශ්‍රිත ව වරලත්හිමියා හා වරලත්ලාභියා ලෙස දෙපාර්ශ්වයක් සම්බන්ධ වේ.

P වරලත් හිමියා හා වරලත්ලාභියා අතර ගිවිසුම්ගත සම්බන්ධතාවක් පැවතීම

වරලත් ව්‍යාපාර ආරම්භවනුයේ වරලත් හිමියා සහ වරලත් ලාභියා අතර ඇතිකරගත් එකඟතාවක් මත ය. මෙසේ ඇතිකරගත් ලිඛිත එකඟතාව වරලත් ගිවිසුම ලෙස හැඳින්වේ.

P වරලත් ලාභියා විසින් වරලත්හිමියාට ගෙවීමක් කිරීම

වරලත්හිමියා විසින් තමන්ගේ වෙළෙඳනාමය යටතේ භාණ්ඩ හා සේවා අලෙවි කිරීමට වරලත් ලාභියාට අවසරය ලබාදෙන්නේ කිසියම් ගාස්තුවක් මත වේ. මේ පිළිබඳ තොරතුරු වරලත් ගිවිසුමේ ඇතුළත් විය යුතු ය.

## වරලත් ව්‍යාපාරවල වාසි

වරලත් ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය තුළින් වරලත් හිමියාටත්, වරලත් ලාභියාටත් පොදුවේ අත්පත් කරගත හැකි වාසි කිහිපයකි.



නොමිලේ බෙද හැරීම සඳහා ය.

## වරලත්හිමියාට අත්පත් කරගත හැකි වාසි

- P වරලත්හිමියාට ඔහුගේම ආයෝජනයකින් තොරව වෙනත් වෙළෙඳපළවල් තුළ ව්‍යාපාර කටයුතු පුළුල් කර ගැනිමට අවස්ථාව උදා වීම

- P විශාල සේවක මණ්ඩලයක් පවත්වා ගැනීමෙන් දැරීමට සිදු වන පීඩනය අවම කර ගනිමින් මහා පරිමාණ වාසි භුක්ති විඳීමට හැකි වීම

- P වරලත්හිමියාට ආදායමක් ලැබීම

## වරලත්ලාභියාට අත්පත් කරගත හැකි වාසි

- P වරලත්හිමියාගේ කීර්තිනාමයෙන් ලාභයක් ඉපැයීමට වරලත් ලාභියාට අවස්ථාව උදාවීම

- P වරලත්හිමියාගේ කීර්තිනාමය මත වරලත් ලාභියාට ජනප්‍රිය වෙළඳපළකට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වීම

- P වරලත්හිමියාගේ කළමනාකරණ පුහුණුව වරලත්ලාභියාට හිමිවීම

## වරලත් ව්‍යාපාරවල සීමා

### වරලත්හිමියාට

- P වරලත්ලාභියාගේ අසාර්ථක වෙළෙඳ කටයුතු තුළින් වරලත්හිමියාගේ කීර්තිනාමයට හානි සිදුවිය හැකි ය

- P වරලත් ව්‍යාපාර කටයුතු කිරීමේදී ඇතිවන නෛතික බැඳීම් හා සීමාවන්ට යටත් වීමට සිදු වීම

### වරලත්ලාභියාට

- P වරලත් ව්‍යාපාර ක්‍රමය ලබාගැනීමට වරලත්ලාභියාට නෛතික ගාස්තු, බැංකු ගාස්තු, ස්ථාපිත කිරීමේ වැයදම් වැනි පිරිවැය දැරීමට සිදුවීම

- P වරලත්හිමියාගේ පාලනයක් ඇති නිසා වරලත්ලාභියාට පූර්ණ ස්වාධීනත්වයෙන් යුතු ව කටයුතු කළ නොහැකි වීම

- P වරලත්හිමියාට ඉහළ පුරස්කාරයක් හා ගාස්තු ගෙවීමට සිදු විය හැකි වීම

### ක්‍රියාකාරකම 07

විවිධ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ අඩංගු ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

01. තනි පුද්ගලයෙකුට හිමි, අඛණ්ඩ පැවැත්මක් හා නෛතික පුද්ගලභාවයක් හිමි ව්‍යාපාර

02. පුද්ගලයන් කිහිපදෙනෙකු එකතු වී ප්‍රාග්ධනය යොදා පවත්වාගෙන යන වගකීම් අසීමිත ව්‍යාපාර

03. තනි පුද්ගලයෙකු විසින් පවත්වාගෙන යන වගකීම් අසීමිත සහ නෛතික පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර

ඉහත ප්‍රකාශ හොඳින් කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ඒ ඒ ප්‍රකාශයෙන් විස්තර කරන ව්‍යාපාර සංවිධාන වර්ගය දක්වන්න.
02. එක් එක් ව්‍යාපාර සංවිධාන වර්ගය සඳහා ව්‍යාපාර නාමයක් බැගින් යෝජනා කරන්න.
03. ඒ ඒ ව්‍යාපාර සංවිධාන වර්ගයට අදාළ වන අණ පනත් නම් කරන්න.

### ක්‍රියාකාරකම 08

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වරලත් ව්‍යාපාර නම් කරන්න.

## පිළිතුරු ලියමු.

01. ව්‍යාපාර සංවිධානවල පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ මොනවාද?

02. කේවල ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි මූලික ලක්ෂණ මොනවාද?

03. හවුල් ගිවිසුමක ඇතුළත් විය හැකි කරුණු දක්වන්න.



04. හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන්න.

05. වරලත් ගිවිසුමකට සම්බන්ධ විය හැකි පාර්ශ්ව නම් කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.